# සංවර්ධනය හා සන්නිවේදනය

**අසිත මල්ලවආරච්චි ***

නූතන ලෝකයේ සමාජ ආර්ථික රටාව තුළ 'සංවර්ධනය' (Development) යන්න අතිශය සංකීර්ණ මාතෘකාවක් බවට පත්ව ඇත. ''සංවර්ධනය යන්න, මිනිසාගේ සිත් තුළට මතවාදයක් ලෙස ප්‍රවේශ වන්නට ඇත්තේ ඔවුන් ශිෂ්ටාචාර වීමේ මුල්ම අදියරේදී වන්නට ඇතැයි විශ්වාස කෙරේ'' (Jeorge, 1979: 235). කලින් කල සමාජය තුළ මතු වී පෙනුන සමාජ විචල්‍යතාවයක් හේතුකොට ගෙන සංවර්ධනය යන්න ලෝක සමාජය තුළ සාකච්ඡාවට බඳුන් වී ඇත. ඒ තුළින් සමාජය තුළ කාලානුරූපී වෙනස්කම් බොහොමයක් ද සිදු වී ඇත. මානව සමාජය තුළ පැනනැඟුණ විවිධ සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික හා දේශපාලනික විපර්යාසයන් පදනම් කොටගනිමින් සමාජයන් විවිධ පරාවර්තනයන්ට බඳුන් විය.
විද්‍යාවේත්, තාක්‍ෂණයේත් ඉම පුළුල්වත්ම, මිනිසා සතුව පැවතියා වූ ඥාණ සම්භාරය ද ඊට සාපේක්‍ෂව වැඩි වර්ධනය වන්නට වූයෙන්, සකලවිධ මානවයාට ඔවුන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාවය වැඩි වන්නට විය. එහි අවසන් ඵලය වන්නේ සංවර්ධනය හා සන්නිවේදනය අතර පුළුල් සම්බන්ධතාවක් ගොඩනැගීමය.

## සංවර්ධන සංකල්පය

සංවර්ධනය (Development) පිළිබඳ අදහස මුලින්ම බිහිවීම පිළිබඳ අවධානය යොමු කිරීම, සංවර්ධනය පිළිබඳ අදහස හොඳින් තේරුම් ගැනීම සඳහා වැදගත් වේ. පුද්ගල හෝ ආයතනික මෙන්ම ජාතික හෝ අන්තර්ජාතික විපරිණාමයන් ගණනය සඳහා 'ප්‍රගතිය' (Progress) යන අර්ථය දීමට මෙන්ම සංකල්පිත සැලකිල්ලක් ලෙස සංවර්ධනය (Development) යන්නෙහි පෘථුල භාවිතයන් පශ්චාත් - ද්විතීය ලෝක සංග්‍රාමය සමඟ බැඳුණු සංසිද්ධියක් වූ බව හඳුනා ගත හැකිය. 1994 දශකය තුළදී මෙන්ම 50/60 දශකවල, සංවර්ධනය යන්න වර්ධනය (Growth), නවීකරණය (Modernization), විපරිණාමය (Change), ප්‍රජාතන්ත්‍රවාදය (Democracy), ඵලදායීත්වය (Productivity), කාර්මීකරණය (Industrialization) සහ ඒ සමාන ඓතිහාසික විපරිණාමයන් ගණනාවක් සඳහා ම පර්යාය පදයක් බවට පත්විය. මුලින්ම ඇමරිකාවේ වියතුන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ජනප්‍රියත්වයට පත් කරනු ලබා වැඩිකල් නොගොස්ම යුරෝපය හා ලෝකයේ අව-කාර්මික රටවල ද හඳුන්වා දෙනු ලැබූ 'සංවර්ධනය' නැමැති පදය සාවද්‍ය ලෙසින් නිර්වචනය කරනු ලැබූවක් මෙන්ම, සර්ව භෞමික වශයෙන් අර්ථය හඳුනා ගනු ලැබූවක් නොවූවද, ජාත්‍යන්තර සංවිධානයක් තුළ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්විය (කරුණානායක, 2000: 40).
සංවර්ධනය අද වන විට පර්යේෂණයන් සඳහා භාජනය වන පහසු වචනයක් ලෙස පෙනෙන්නකි. නමුත් එහි අන්තර්ගතය සංකීර්ණය. ආර්ථික, දේශපාලන, සංස්කෘතිය, මානව. විද්‍යාව, ග්‍රාමීය සමාජ විද්‍යාව, අන්තර්ජාතික සබඳතා, අන්තර්ජාතික සන්නිවේදනය ආදී ක්‍ෂේත්‍ර ගණනාවක් තුළ සිදු කළ ව්‍යාපෘතීන් රැසක ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදය තුළ සංවර්ධන අධ්‍යයන කටයුතු පුළුල් විය. 1960 දශකයේ මුල් භාගය තුළදී සංවර්ධනයේ සුවිශේෂී ප්‍රගතීන් හඳුනාගන්නට ලැබුණි.
සංවර්ධනය යන වචනය දෙවන ලෝක යුද්ධයේ අවසානය දක්වාම සාහිත්‍යගත වූයේ නැත. බොහෝ විට සංවර්ධනය යන්නෙන් හැඟී ගියේ 'බටහිරකරණය' හෙවත් 'යුරෝපීයකරණයයි'. පශ්චාත් සංග්‍රාම යුගයේ දී මුල් දශක තුළදී සංවර්ධනය යන වචනයෙහි ජනප්‍රියතාව වැඩිවෙත්ම ලෝකයේ ජනගහනයෙන් සහ සමාජයෙන් බහුතරය හැඳින්වීම සඳහා භාවිත වූ 'නොදියුණු' (Backward) යන වචනය ටිකෙන් ටික දුරස් වී ඌන සංවර්ධිත (Under–Development) සහ සංවර්ධනය (Development) යන වචනය භාවිතයට ගෙන

---

***තාවකාලික කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

ඇත. දෙවන ලෝක සංග්‍රාමයට පසු කාලය තුළ සංවර්ධනය ප්‍රධාන කරුණු හතරක් විස්තර කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත. එනම්,

1. නවීකරණය, ජාතිවාදය සහ දේශපාලනික සංවර්ධනය.
2. ආර්ථික සංවර්ධනය සහ තාක්ෂණික විද්‍යා ව්‍යාප්තිය.
3. අධිරාජ්‍යවාදය සහ ඌන සංවර්ධිත භාවය.
4. විප්ලවය, විමුක්තිය සහ මානව සංවර්ධනය (කරුණානායක, 2000: 42 ).

සංවර්ධනයේ මහා වටිනාකම් තුනක් පිළිබඳ සමාජ ආර්ථික සංවර්ධන පර්යේෂකයෝ සාකච්ඡා කරති. ඉන් පළමුවැන්න මූලික අවශ්‍යතා සම්පූර්ණ වීමයි. දෙවැන්න පුද්ගල ස්වීයත්වය හා ගරුත්වයයි. තෙවැන්න නිදහසයි. මයිකල් පී. ටොඩාරෝ හා ස්ටෙපෙන් සී ස්මිත් (Michael P. Todaro, Stephen C. Smith – 2008) යන ආර්ථික විද්‍යාඥයින් පෙන්වා දෙන ආකාරයට සංවර්ධනයට මූලික අරමුණු 03 කි.

(i) ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය සුරක්ෂිතතාවය වැනි ජීවන පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සුලබ කිරීම හා බෙදා හැරීම.
(ii) රැකියා අවස්ථා, අධ්‍යාපන අවස්ථා නිර්මාණයන් මානව හා සංස්කෘතික වටිනාකම් නිර්මාණය තුළින් ඉහළ ආදායම් ලැබීමට අමතරව ජීවන මට්ටම උසස් කිරීම.
(iii) මිනිසුන් සඳහා වඩාත් පුළුල් ආර්ථික, සමාජ අවස්ථා විවෘත කිරීමෙන් ඔවුන් යටත්භාවයෙන් හා වහල් භාවයෙන් මුදවා ගැනීම ( ලියනගේ, 2010: 24).

"මුල් කාලීන සමාජයේ සංවර්ධනය යන්න සලකන ලද්දේ, ආර්ථිකය පදනම් කොටගත් සංඛ්‍යානමය මිනුම් දඬුවලින් හසුකර ගත හැකි භෞතික දියුණුවයි. නමුත් පසුකාලීනව එය ප්‍රතික්ෂේප විය" (ජිනදාස, 2011: 158). 1982 මෙක්සිකෝ නගරයේ පැවැත්වුණු ජාත්‍යන්තර සමුළුවකදී සංවර්ධනය යන්නට පුළුල් අර්ථ නිරූපණයක් ලබා දී ඇත. සංවර්ධනය යනු ආර්ථික වර්ධනය ඉක්මවා පැතිරෙන සංකීර්ණ, පුළුල් හා බහුමානීය ක්‍රියාවලියක් බවත් මෙම ක්‍රියාවලියට ජන ජීවිතයට අදාළ සියලු අංග ද ඔවුන්ගේ ශක්තිය ද ඇතුළත්ව සමස්ත ජනතාවටම එම ක්‍රියාවලියට දායක වී ඒ තුළින් ලැබෙන වාසි සියල්ල භුක්ති විඳීමයි" (කරුණානායක, 2001: 2-3).

මානවයා ප්‍රමුඛ කොටගත් සත්ව ලෝකයෙහි ප්‍රභවය, පැවැත්ම පිළිබඳව සලකා බලන කල එය විවිධ ගැටුම්කාරී හැලහැප්පීම් මැද විකාශනය වූවක් ලෙස හැඳින්විය හැකිය. කිසියම් විධිමත් බවක් හා ක්‍රමවත් බවක් පිළිබඳ ඉව වැටුණු මානව කොට්ඨාශ ස්වකීය ජීවිතවල ඉදිරියක් අපේක්ෂා කරන්නට ඇත. කල්යාමේදී විද්‍යාව හා තාක්ෂණය මෙන්ම එකිනෙකා සතු දැනුම් මට්ටම සහ සෙසු ක්‍රමෝපායන් උපයෝගී කොට ගනිමින් ඔවුන් එකී අපේක්ෂාවන් ප්‍රායෝගිකත්වයට නංවන ලදී (නානායක්කාර, 2008: 21-22).

සංවර්ධනය යන වචනයේ වාච්‍යාර්ථය වන්නේ 'මනා වූ වර්ධනය' යන්නයි. රටක ස්ථාවරය පැවැත්ම තීන්දු කරන ප්‍රධාන සාධකය වන්නේ සංවර්ධනයයි. සංවර්ධනය මූලික වශයෙන් කොටස් 2 කට බෙදා දැක්විය හැකිය.

I. භෞතික සංවර්ධනය
II. අධ්‍යාත්මික සංවර්ධනය

භෞතික සංවර්ධනය යන්න ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, පාරිසරික, සංස්කෘතික, සමාජීය, සදාචාරාත්මක ආදී වශයෙන් උප ක්ෂේත්‍රයන් ගණනාවකට බෙදා දැක්වීමට පුළුවන.

අධ්‍යාත්මික සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ මානසික පවිත්‍රතාවයයි. ඒ අනුව භෞතික හා අධ්‍යාත්මික යන දෙආකාර වූ සංවර්ධන ක්‍රියාවලිය අංග සම්පූර්ණ සංවර්ධනයක් ලෙස පෙන්වා දිය හැක.

සංවර්ධන සංකල්පය පිළිබඳ විශේෂඥයෙකු වන ඩෙනිස් ගෝලේට (Dennis Goalie) අනුව සංවර්ධනය යනු පුළුල් අර්ථයක් ඇති සංකල්පයකි. එය එක් අංශයක් හෝ එක් පාර්ශවයක් හෝ පිළිබඳ වර්ධනයක් හෝ ප්‍රගතියක් හෝ පමණක් ගෙනහැර දක්වන සංකල්පයක් නොවේ. සංවර්ධනය හුදෙක් සමාජ ව්‍යුහයේ පොදු ආකල්පවල හා පොදු ආයතනවල සමාජ විපර්යාසයක් මෙන්ම ආර්ථික සංවර්ධනය වේගවත් කරලීම, සමාජ

විෂමතා බැහැර කරලීම හා දුගී දුප්පත්කම මුලිනුපුටා දැමීම ආදිය ඇතුළත් වන්නා වූ සම්පූර්ණ ක්‍රියාවලියයි. සංවර්ධනය යන්න ඉඳුරාම විවිධ පුද්ගලයන්ගේ මෙන්ම විවිධ සමාජ කොටස්වල අවශ්‍යතා සහ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමට තුඩු දිය යුතුය. තවද පවතින අස්ථිර සමාජ තත්ත්වයන්ගෙන් මිදී යහපත් හා ගුණවාදී සමාජ හා ආර්ථික තත්ත්වයන් කරා ළඟාවීමට හේතුකාරක වන තත්ත්වයන් අදාළ ක්‍රියාදාමයට ඇතුළත් විය යුතුය ( කරුණානායක, 2001: 3 ).

සංවර්ධනය යන යෙදුම මනඃකල්පිත ජාලයක් බවත් එහෙයින් නිසිලෙස අර්ථ ගැන්වීම අපහසු බවත් ඩඩ්ලි සියර්ස් (Dudley Seers) පෙන්වා දෙයි (Seers, 1977: 36). ඒ අනුව සංවර්ධනය යන්න මුලුමනින්ම 'වැඩි දියුණුව' යන්නට පර්යාය පදයක් ලෙස ප්‍රතිමාන වූ සංකල්පයක් වශයෙන් අනිවාර්යයෙන්ම සලකා බලනු ලබන බව සියර්ස් අවධාරණය කර ඇත. සංවර්ධනය යන්න හුදු සංඛ්‍යාලේඛන මඟින් ප්‍රකාශ වන ඒක පුද්ගල ආදායමේ හෝ ජාතික ආදායමේ හෝ වර්ධන ප්‍රවේගය අනුව මැනිය නොහැකි බව සියර්ස් වැඩිදුරටත් පෙන්වා දී ඇත.

ආර්ථික විද්‍යාඥයින් සංවර්ධනය ලෙස හඳුන්වා දී ඇත්තේ ''පුද්ගලයාගේ ජීවන තත්ත්වය උසස් වන ක්‍රියාවලියක්'' වශයෙනි. ආර්ථික විද්‍යාඥ ගුනර් මයිඩාල් (Gunnar Myrdal) සංවර්ධනය විග්‍රහ කර ඇත්තේ, 'සමස්ත සමාජ ක්‍රමයේම ඉදිරි ගමන හෝ විප්ලවීය වෙනස්වීමක්'' (මාර්ග පරිවර්තන, 1978: 49 ) වශයෙන් ය. මහාචාර්ය විමල් දිසානායක දක්වන ආකාරයට ජාතික සංවර්ධනය යන්න ප්‍රධාන අංශ කිහිපයකින් සමන්විත වේ. ප්‍රධාන වශයෙන් ආර්ථික සංවර්ධනය, සාමාජික සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය හා සදාචාරාත්මක සංවර්ධනය යන කොටස් ඊට ඇතුළත් වේ (දිසානායක, 2009: 12).

මාක්ස්වාදීන්, සංවර්ධනය යන්න විග්‍රහ කර ඇත්තේ 'ශ්‍රමය' යන සංකල්පය පදනම් කරගෙනය. ස්වභාවධර්මය හැරුණු විට ධනය බවට පරිවර්තනය කළ හැකි වැදගත්ම මූලාශ්‍රය වන්නේ ශ්‍රමයයි. එබැවින් මාක්ස්වාදීන් පෙන්වා දෙන්නේ තිරිසන් සත්වයෙකු ශිෂ්ටාචාරවත් මානවයෙකු බවට පත් කරමින් ශ්‍රමය විසින් කරන ලද කාර්යය සංවර්ධනයේ මුල්ම ප්‍රවේශය බවයි. ඒ අනුව සංවර්ධනය යනු, ''විෂමතාවයකින් තොර යහපත් ජීවන පැවැත්මක් කෙරෙහි ලා මනා ලෙස යොදාගත් ශ්‍රම ශක්තීන්ගේ එකතුවයි. එහි නියම වටිනාකම් හා නිෂ්පාදන බලවේග තීරණය වීම සැබෑ සමාජ සංවර්ධනයේ මුල්ම හැඳුනුම්පත වේ'' (Marx, 1859: 122).

සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමේදි අපට අමතක කළ නොහැකි සංකල්ප දෙකක් පවති. එනම්

1. සහභාගිත්ව සංවර්ධනය (Participatory Rural Appraisal – PRA)
2. තිරසාර (ධරණීය) සංවර්ධනය (Sustainble Development)

**සහභාගිත්ව සංවර්ධනය (Participatory Rural Appraisal – PRA)**

දිළිඳුකම පිටුදැකීම සඳහා සංවර්ධන ක්‍රියාකාරකම් තුළ පැවති දුර්වලතා අවම කරගැනීමේ අරමුණ සහිතව ජනතා සහභාගිත්වය හා පුරෝගාමිත්වය සහිත වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා 1970 දශකයෙන් පසු ආරම්භ කළ විකල්ප සංවර්ධන ප්‍රවේශය ලෙස සහභාගිත්ව සංවර්ධනය (Participatory Rural Appraisal – PRA) හැඳින්විය හැක. මෙම සංවර්ධන ප්‍රවේශය නූතන සංවර්ධන වැඩසටහන්වල ප්‍රධාන දර්ශනය බවට පත්ව තිබේ. සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රමෝපායන් මඟින් ප්‍රජා සංවර්ධනය සඳහා වූ සේවය අවම වීම හේතුවෙන් දිළිඳුකම පිටු දැකීම සඳහා ප්‍රමුඛ සංවර්ධන ප්‍රවේශයක් ලෙස සහාභාගිත්ව සංවර්ධනය, සංවර්ධනය වෙමින් පවතින රටවල භාවිත වේ. දිළිඳු ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා යොදා ගන්නා මෙම ක්‍රමවේදයෙහි ප්‍රධාන අරමුණු කිහිපයකි.

1. මූලික අවශ්‍යතා සපුරාලීම.
2. නිර්මාණාත්මක හැකියාවන් එළිදැක්වීම.
3. ස්වයං විශ්වාසය හා ස්ව ශක්තිය වර්ධනය කිරිම.
4. සමාජ සාධාරණත්වය ඇති කිරිම.
5. කාන්තා සවිබලකරණය.
6. ජනතා සහභාගිත්වය.

7. ස්වාධීන හා සහයෝගීතාව ඇති කිරිම.
8. පරිසර සංරක්ෂණය (http;//si.wikipedia.org/wiki/participatoryuralappraisal).

මෙලෙස දිළිඳුකම පිටුදැකීම සඳහා සංවර්ධන ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාව තුළ භාවිත සහභාගිත්ව සංවර්ධන වැඩසටහන් ලෙස ජන සවිය,සමෘද්ධි, දිවිනැගුම, මගනැගුම හා පුර නැගුම ආදි වැඩසටහන් පෙන්වා දිය හැකිය.

**තිරසාර (ධරණීය) සංවර්ධනය (Sustainble Development)**

තිරසාර සංවර්ධනය යනු මූලිකවම පරිසරයේ පවත්නා සම්පත්වලින් ප්‍රයෝජන ගන්නා අතර ම අනාගතය සඳහාද ඒවා සුරකීමයි. එහිදි පවත්නා සම්පත් වර්තමානයේ ප්‍රයෝජන ගැනිම, ඒවා සංවර්ධනය කිරිම මෙන්ම අනාගත පරපුරේ අවශ්‍යතාවන් සඳහා ද ඒ සම්පත් යම් ප්‍රමාණයකට ආරක්ෂා කිරිමයි.
ධරණීය සංවර්ධනය යන සංකල්පය ක්‍රමාණුකූලව ලොව තුළ ප්‍රතිස්ථාපිත වූයේ 1992 වර්ෂයේදි එක්සත් ජාතින්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සමුළුව තුළිනි. මෙය රියොද ජැනැයිරෝ නගරයේදි ජූනි මස 03 වන දින සිට 14 වන දින දක්වා පවත්වමින් තිරසාර සංවර්ධනය සඳහා රාජ්‍යමය ආකල්ප යම් තරමකට වෙනස් කිරිමට උත්සහ දරණ ලදි. මෙය "මිහිතල සමුළුව" ලෙසද නම් කරන අතර ආර්ථික ජීවිතයේ සෑම අංශයකම ප්‍රතිපත්ති සෑදීම හා ක්‍රියාත්මක කිරිමට මුල් වන ප්‍රධාන කරුණ බවට තහවුරු කරන ලදි. සෑම මිනිසෙකුටම ස්ථාවර අනාගතයකට මුහුණ දිය හැකිවන සේ පෘථිවි පරිසරය රැකගැනීමේ අවශ්‍යතාවයත්, පරිසරය හා ආර්ථික කටයුතු අතර ගැළපීමක් ඇති කිරිමටත් අවශ්‍ය ස්ථාවර පියවර පිළිබඳ තීරණ සෙවීමට මෙය පදනම් විය (http;//si.wikipedia.org/wiki/sustainbledevelopment).
සංවර්ධනය පිළිබඳ නවීනතම මතවාදය වන්නේ සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්ය (Millenium Development Goals). එක්සත් ජාතින්ගේ සංවිධානයට අයත් සමස්ත රටවල් 192 හා තවත් අන්තර්ජාතික සංවිධාන 23කට ආසන්න ප්‍රමාණයක එකතුවෙන් 2015 දි ළඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් 08 සහශ්‍ර සංවර්ධන ඉලක්කයන් (Millenium Development Goals) ලෙස හඳුන්වනු ලැබේ. එක්සත් ජාතින්ගේ 65වන සමුළුවට සමගාමීව 2010 සැප්තැම්බර් 22 වන දින පවත්වන ලද සාකච්ඡාවේදි සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් ගන්නා ලද ලෝක මට්ටමේ ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මක් ලෙස මෙම සහශ්‍ර සංවර්ධන ඉලක්ක සැලකිය හැක. එම සහශ්‍ර සංවර්ධන ඉලක්කයන් වන්නේ,

1. දිළිඳුකම හා සාගින්න පිටු දැකිම (End Poverty and Hunger).
2. සැමට ප්‍රාථමික අධ්‍යාපනය (Universal Education).
3. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව (Gender Equaity).
4. ළමා සෞඛ්‍ය (Child Health).
5. මාතෘ සෞඛ්‍ය (Meternal Health).
6. ඒඩ්ස් පැතිරීම වැළැක්වීම (Combat HIV/AIDS).
7. තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති හරහා ස්වභාවික සම්පත් රැකගැනීම (Environmental Sustainability).
8. සංවර්ධනය උදෙසා ලෝක ව්‍යාප්ත සහභාගිත්වය (Global Partnership) (http;//www.un.org/millenniumgoals).

උක්ත පැහැදිලි කිරීමට අනුව සංවර්ධනය යනු පොදු මිනිසා හා පරිසරය ඇතුළු සමස්තය තුළ සිදු කෙරෙන යහපත් වෙනස ලෙස අවධාරණය කළ හැක. පසුගිය කාලය තුළ ඌන සංවර්ධිත රටවල සාම්ප්‍රදායික සමාජයන්හි ඇති වූ තාක්‍ෂණික වෙනස්වීම් අතුරින් ඉතාම මූලික වූත්, මානවයා කෙරෙහි ප්‍රබල බලපෑම් ඇතිවූත්, වෙනස්වීම සන්නිවේදනයයි. රටකට සංවර්ධනය කරා එළඹෙන්නට අවශ්‍ය සමස්ත ක්‍රියාදාමය

අපේක්ෂිත ඉලක්කයන් කරා ගෙන යන්නට මූලික වනුයේ සන්නිවේදනයයි. ඒ ඔස්සේ සංවර්ධනාත්මක සන්නිවේදනය ලෝකයට බිහි වී ඇත.

## සංවර්ධනාත්මක සන්නිවේදනය (Development Communication)

සන්නිවේදනය යන්න මානව ශිෂ්ටාචාරය බිහිවීමේ මුල් අවධිය තෙක් දිව ගිය සංකීර්ණ මාතෘකාවකි. සරළ අර්ථයකින් ප්‍රකාශ කළහොත් මානවයා මිහිමත රඳාපවතින්නේද සන්නිවේදනය මුල් කොටගෙනය. යම් හෙයකින් සන්නිවේදනය නොතිබුණානම් මේ සා විශාල මානව සමාජයක් ලොවතුළ බිහිවීමටද ඉඩ නොතිබිණි. මිනිසාගේ බිහිවීමේ සිටම ඔහු සන්නිවේදනයේ නිරත වී ඇත. සන්නිවේදනය යන්න සරලව අර්ථ නිරූපනය කළහොත් තොරතුරු හුවමාරුවයි. පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකු හෝ පිරිසක් සමඟ සිදු කරනු ලබන අදහස් හුවමාරුව සන්නිවේදනය වේ. සන්නිවේදනය යන්න ඉතා පුළුල් ලෙස සලකා බලන කළ එය මානව අන්තර් ක්‍රියාවලියක් ලෙස දක්වයි (Garbner,1972: 35). එය සංකේත හුවමාරු ක්‍රියාදාමයක් (Thomes,1980: 12) ලෙසද සමාජානුයෝජන ක්‍රියාවලියක් මෙන්ම මානව අන්තර් සම්බන්ධතා කෙරෙහි වන පදනම ලෙසද දැක්විය හැකිය.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මෙම ඉදිරිපත් කිරිම් සන්නිවේදනය පිළිබඳ පරිපූර්ණ අර්ථකතනයන් නොවුවද සන්නිවේදනය යන වචනයෙහි සමස්තාර්ථය දනවන නිර්වචන සමූදායක් ලෙස පිළිගත හැකිය. ඒ අනුව උක්ත අර්ථකථනයන් සංවර්ධන සන්නිවේදනය නැමති උපවිෂය සඳහා උපයුක්ත මූලික ප්‍රවේශයක් ලෙස දැක්විය හැකිය.

සංවර්ධනාත්මක සන්නිවේදනය යන්නෙන් සරලව අදහස් කරනු ලබන්නේ රටක සංවර්ධනාත්මක ප්‍රවේශයක් පිළිබඳව පවතින ජනමාධ්‍යයෙහි දායකත්වයයි. ''සංවර්ධනාත්මක සන්නිවේදනය යන්න ඉතා පුළුල් විෂය පරාසයක් ලෙස හඳුනාගනු ලැබුවේ 1960 - 1978 දශකවලදීය'' (නානායක්කාර, 2008: 66). මෙහිදී ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත ආදී ප්‍රධාන ජනමාධ්‍යන් සංවර්ධන ක්‍රියාදාමයේදී සක්‍රීයව කටයුතු කරනු ලැබේ. විල්බර් ශ්‍රාම් (Wilbur Schramm) විසින් 1964 දී ලියන ලද 'ජන සන්නිවේදන හා ජාතික සංවර්ධනය'' (Mass Media and National Development) යන කෘතිය දියුණුව හා දියුණුව කරා යන රටවල ජන සන්නිවේදන විද්‍යාඥයින් අතර මහත් බලාපොරොත්තු ඇති කළ කෘතියක් විය (උපුටා ගැනීම, කරුණානායක, 2001: 4 ). ඒ අනුව විල්බර් ශ්‍රාම් (Wilbur Schramm) සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විග්‍රහ කර ඇත්තේ මෙසේය. ''තොරතුරු සම්පාදනයේදී හා අධ්‍යාපනයේදී ජනමාධ්‍යයේ හා නව මාධ්‍යයන්ගේ කාර්යභාරය වන්නේ සංවර්ධනය සඳහා වන සමාජ වෙනස්වීම වේගවත් කිරීමයි. එය පහසු කරවීමයි'' (Schramm, 1964: 41-42).

මහාචාර්ය විමල් දිසානායකයන් දක්වන ආකාරයට සංවර්ධන සන්නිවේදනය යනු ''කිසියම් ජනතාවක් දරිද්‍රතාවයෙහි සිට වඩාත් සමෘද්ධි සම්පන්න තත්ත්වයක් කරා පත් කිරීමටත්, ආර්ථික වෘද්ධියක් ඇති කිරීමටත් සමාජ සමානාත්මතාවක් පතළ කිරීමටත්, මිනිසාගේ නෛසර්ගික ශක්‍යතාවලින් නිසි ප්‍රයෝජන ලබාගැනීමටත්, අනුබල දෙන සන්නිවේදනය, සංවර්ධනාත්මක සන්නිවේදනය ලෙස හැඳින්විය හැකිය''(දිසානායක, 2009: 17).

පිලිපීන රාජ්‍ය විශ්වවිද්‍යාලයේ, ලොප් බැනියොස්හි සංවර්ධන සන්නිවේදන දශකයක් 60 දශකය අග භාගයේදී ඇති කරන ලදී. මෙහි මූලිකව ක්‍රියාකළ නෝරා ක්වෙබ්‍රාල් (Nora quebral) සංවර්ධන සන්නිවේදනය අර්ථ දක්වා ඇත්තේ ''සංවර්ධන සන්නිවේදනය යනු යම් රටක් දුගී දුප්පත්කමින් බැහැර කොට එහි ආර්ථික හා සමාජ සුභසිද්ධිය ඇති කරවන ක්‍රියාවලියකි. සංවර්ධන සන්නිවේදනය යනු මානව සන්නිවේදන කලාව මෙන්ම විද්‍යාවයි. සංවර්ධන සන්නිවේදනය තුළින් පුළුල් ආර්ථික හා සමාජ සමානාත්මතාවය ඇති කළ හැක. එමෙන්ම එමඟින් මානව අවශ්‍යතා සියල්ල සපුරාලීමට ද හැකියාව ඇත (උපුටා ගැනිම, කරුණානායක, 2001: 04 ).

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් විසින් රචිත සන්නිවේදන ශබ්දාකරයේ සංවර්ධනාත්මක සන්නිවේදනය සංවර්ධන කටයුතු සඳහා සන්නිවේදනය භාවිතයට ගැනීම පසුබිම් කරගෙන බිහි වූ සංකල්පයක් ලෙස දක්වා ඇත. ඒ අනුව සාමාජික වශයෙන් වෙනස් කළ යුතු සාධක හඳුන්වා දීම මෙම සංකල්පයේ පදනම ලෙස දක්වයි (මහේන්ද්‍ර, 1997: 84 ).

1986 නොවැම්බර් මස සිංගප්පූරුවේ පැවති සංවර්ධන සන්නිවේදනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී ආචාර්ය ඒ. ටී. ආරියරත්න ප්‍රකාශ කර ඇත්තේ 'සංවර්ධන සන්නිවේදනය ලෝක බැංකුවේ නිපදවූ වෙළෙඳ භාණ්ඩයක් අලෙවි කරන්නෙකු හෝ සංවර්ධන කළමනාකරණ කම්හලක නිපදවූ එවැනිම භාණ්ඩයක් අලෙවි කරන්නෙකු ද නොවේ. සංවර්ධන සන්නිවේදනයට අයත් කාර්යය වන්නේ සංවර්ධනය පිළිබඳ විවිධ ජනයා සිතන පතන ආකාරය දැනගැනීමට සැලැස්වීමයි. ගැමි මට්ටමේ නැත්නම් සමාජයේ අවම සම්පත් භුක්ති විඳින ජන කොටස්වල සංකල්ප මත අපේක්ෂා හා අත්දැකීම් පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීමයි'' (කරුණානායක, 2001: 4-5).

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විමසා බලන විට එය සංකල්පයක් ලෙස ලොව පුරා ප්‍රචලිත විය. රටක ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික, සෞඛ්‍ය ආදී සෑම ක්ෂේත්‍රයකින්ම සංවර්ධනයක් ඇති කිරීම සඳහා මෙම සන්නිවේදනය භාවිත කළ හැකිය. සන්නිවේදනය බොහෝ විට සංවර්ධනය සඳහා ලබාදෙන්නා වූ යටිතල පහසුකමක් ලෙස සැලකිය හැකිය. එමෙන් ම නව තාක්ෂණයේ බිහිවීමත් සමඟ සංවර්ධන සන්නිවේදනය පුළුල් ලෙස පැතිරී තිබේ. ආර්ථික විද්‍යාඥයින්ගේ මතය වන්නේ, සංවර්ධන සන්නිවේදනය ආර්ථික සංවර්ධනයේ කොන්දේසියක් බවයි. සන්නිවේදන තාක්ෂණය, එය භාවිත කරන ආකාරය හා සමාජය විසින් ග්‍රහණය කර ගන්නා ආකාරය සංවර්ධන සන්නිවේදනයේදී ඉතා වැදගත් සාධක වේ.

'සංවර්ධන සන්නිවේදනයේ ප්‍රධානතම භූමිකා ලෙස සලකනු ලබන තොරතුරු (Information), අධ්‍යාපනය (Education), සන්නිවේදනය (Communication), අභිප්‍රේරණය (Motivation) යන කරුණු විග්‍රහ කිරීම ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වී ඇත. මෙම ක්‍රියාවලීන් රාජ්‍ය මූලිකව පමණක් නොව පෞද්ගලික අංශයේ ද සහයෝගයෙන් යුක්තව සංවර්ධන ක්‍රියාවලිය හා සම්බන්ධව කටයුතු කිරීම කළ යුතු බව මහාචාර්ය උමා නරුලා (Uma Narula – 2002) එළිදැක්වූ සංවර්ධන සන්නිවේදන කෘතියේ අවධාරණය කර දක්වා ඇත (ලියනගේ, 2010: 39).

සංවර්ධන සන්දේශයක් ඉදිරිපත් කිරීමේදී ඉලක්ක ප්‍රජාව (Target community) කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු අතර එහිදී අව්‍යාජ බව, සුහද බව, ආකර්ශනීය බව වැදගත් කොට සැලකිය හැක. සංවර්ධනාත්මක සන්නිවේදනය විශේෂයෙන්ම ග්‍රාමීය සමාජය සංවර්ධනය කිරීමට යොදාගත යුතුය. සංවර්ධනාත්මක සන්නිවේදනයේ ඵලදායී බව මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් දක්වා ඇත්තේ මෙසේය. "Give a man a fish and he can eat fish once, teach him to raise fish and he can eat fish for the rest of his life" (Mahendra, 1997: 61)

මහාචාර්ය විල්බර් ශ්‍රාම් (Wilbur Schramm) දක්වන පරිදි සංවර්ධන සන්නිවේදනයෙහි ප්‍රධාන රේඛා සිව් වැදෑරුම් වේ.

(i) හුදෙකලාවට වඩා සහභාගීත්වය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යය.

(ii) දැනමුත්තෙකු බවට පත්වී සිටීම මුගන්ධභාවයේ ගිලී සිටීමට වඩා අවශ්‍ය වූවකි. මිත්‍යාවේ ගැලී සිටීමෙන් ජනයා මුදවා ගැනීමත් නිසි අධ්‍යාපනයක් ලබාදීමත් සුදුසු වන බව මෙහිලා සැලකෙන අතිරේක අංගයකි.

(iii) ජීවිත කාලය ඇතුළත දී වඩාත් නිරෝගීව සිටීම රෝගාතුර බවෙහි සිටීමට වඩා වැදගත්ය.

(iv) සංසන්දනාත්මක වශයෙන් සලකා බලන කළ ජීවත් වීමට අවශ්‍ය සම්පත් සහිතව සිටීම, සම්පත් රහිත වීමට වඩා වැදගත්ය'' (මහේන්ද්‍ර, 1997: 84).

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ දැඩි විවාදාත්මක කරුණු සාකච්ඡා වන්නට පටන් ගත්තේ 1970 දශකයේදීය. 1976 දී ප්‍රකට ලතින් ඇමරිකානු සන්නිවේදන විශේෂඥයකු වූ බෙල්ට්‍රාන් (Beltran) සංවර්ධනය හා සන්නිවේදනය පිළිබඳ මනෝවිද්‍යාත්මක කරුණු ඉදිරිපත් කළේ සංවර්ධන සන්නිවේදනය පිළිබඳ තිබුණු අපේක්ෂාවන් සාර්ථක නොවුණ විටදීය. සමහර රටවල් තුළ ජනමාධ්‍ය සංවර්ධනය සඳහා මැදිහත් නොවන අවස්ථා ද අපට දැකගත හැකිය.

සංවර්ධනාත්මක සන්නිවේදනය පිළිබඳ බහුතරයේ මතය වන්නේ සංවර්ධනය පිළිබඳ කුමක් හෝ ලිපියක් ඡායාරූපයක් නැතහොත් වැඩසටහනක් මාධ්‍යයෙහි පළ කිරීම පමණක් සංවර්ධනාත්මක සන්නිවේදනයට අයත් වූවක් ලෙසය. නමුත් රටක සංවර්ධනය පිළිබඳව විද්‍යානුකූලව මහජනයාට තොරතුරු සන්නිවේදනය

කිරීම එතරම් පහසු කටයුත්තක්ද නොවේ. මේ නිසා සංවර්ධනාත්මක සන්නිවේදනය සෑම විටම විද්‍යාත්මකය. එය අතිශෝක්තියෙන්ද තොර වූවකි. ඒ අනුව රටක සංවර්ධන ව්‍යාපෘති හා පර්යේෂණ ව්‍යාපෘති හා පර්යේෂණ පිළිබඳව විද්‍යාත්මක පදනමක පිහිටා කතා කිරීම ඉතා වැදගත් වේ. රටක සංවර්ධනයේ සුවිශේෂ අවස්ථා පිළිබඳව වාර්තා කිරීමට පවතින අවකාශය ඉතා පුළුල්ය. මේ සඳහා වැදගත්කම ලබාදිය යුත්තේ විද්‍යාත්මක ඥානය සරල සාමාන්‍ය ජනතාවට තේරුම්ගතහැකි ආකාරයට සන්නිවේදනය කිරීමයි. ජනමාධ්‍ය විෂය ක්ෂේත්‍රය සතු සුවිශේෂතා එහිදි භාවිත කරන්නට මාධ්‍යවේදියාට අවකාශය පවති. සුදුසු ආකෘතිය, වචන, රටා, පෙළගැස්ම, ඡායාරූප, සංඛ්‍යාලේඛන හා නිර්මාණ මඟින් අදාල සංදේශය දියුණු තියුණු කළ හැක. අවශ්‍ය වන්නේ මේ සියල්ල සාමාන්‍ය ජනතාවගේ ආකර්ශනයට, අවධානයට ලක්වන පරිදි පෙළ ගැස්වීමයි.

"ගුවන්විදුලිය සංවර්ධනය වන රටවලට අවතීර්ණ වූයේ යටත්විජිතවාදි අත්දැකීම්වල ඍජු ප්‍රතිඵලයක් වශයෙන් යැයි කීම නිවැරදිය. යටත් විජිත සතුව තිබූ බොහෝ බටහිර රටවල් ඒවායේ ගුවන්විදුලිය හඳුන්වා දුන් ගුවන්විදුලි ආකෘතින් එම බටහිර රටවල ඇතිවූ, එම රටවල අවශ්‍යතා පිරිමැසීමට උචිත සමාජ ආර්ථික හා දේශපාලන රටාවක පැණ නැගුණ අතර ඒවා බොහෝ අවස්ථාවලදි කිසිදු වෙනස්කමක් හෝ සංශෝධනයක් නොමැතිව සංවර්ධනය වන රටවලට බද්ධ කෙරිණි" ( කරුණානායක, 1990: 20).

සංවර්ධනය වන ලෝකයේ ප්‍රචලිතම සන්නිවේදන මාධ්‍ය ගුවන්විදුලි මාධ්‍යයි. විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ක්‍රමයන්ගෙන් ගුවන්විදුලිය උපයෝගී කොටගෙන තිබේ. එහි වූ අරමුණු අතර,

1. පෙළඹවීම.
2. දැනුම හා තොරතුරු සැපයීම.
3. ඉගැන්වීම.
4. චර්යාව වෙනස් කිරීම.
5. සංස්කෘතික අඛණ්ඩතාව හා වෙනස්වීම් ඇති කිරීම (කරුණානායක, 1990: 28-31). ප්‍රධාන කොට සැලකිය හැක.

සංවර්ධනය පිළිබඳව සන්නිවේදන මාධ්‍යයන්ගේ භූමිකාව පිළිබඳ සාකච්ඡා කිරීමේදි වර්තමාන ජනමාධ්‍ය පිළිබඳ අමතක කළ නොහැක. ආරම්භක අවස්ථාවේදි ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රබල දායකත්වයක් ලැබුණු අතර වර්තමානයේදි එම තත්ත්වය වෙනස් වී රූපවාහිණිය, සිනමාව, පුවත්පත මෙන්ම නව මාධ්‍ය ද එහි භාරදූර කර්තව්‍යයක් සිදු කරයි. එය හරවත්ව හා නිර්මාණාත්මකව දායක කර ගැනීමට කටයුතු කිරීම සෑම ජනමාධ්‍යකගේම වගකීමද වන්නේය. සංවර්ධන සන්නිවේදන සංකල්පය දෙස විවේචනාත්මකව බැලීමේදී සන්නිවේදනයේ ආරම්භයේ සිට අද දක්වාත් සංවර්ධන ක්‍රියාවලිය සඳහා අඩු වැඩි වශයෙන් ජනමාධ්‍ය යොමුව ඇතිබවට සාක්ෂි ඕනතරම් පවති. ඒ අනුව බිහි වූ සංවර්ධනාත්මක සන්නිවේදන සංකල්පයේ දී සමාජය තුළ විශාල වෙනසක් කිරීමට හැකියාව එයට ලැබෙන බව පැහැදිලිය. සන්නිවේදන ක්‍රියාවලිය කාර්යක්‍ෂම කිරීමට සංවර්ධනය අවශ්‍ය අතර සංවර්ධනයට සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සංවර්ධනය හා සන්නිවේදනය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවක් බව මෙයින් පැහැදිලි වේ.

**ආශ්‍රය ග්‍රන්ථ**


- කරුණානායක, නන්දන, (2001). සන්නිවේදනය සහ සංවර්ධනය, දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.
- කරුණානායක, නන්දන, (1990). 66 වසරක ගුවන්විදුලි ඉතිහාසය, කර්තෘ ප්‍රකාශනයකි.
- ලියනගේ, චමිල. (2010). කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශීය ගුවන්විදුලිය, වැලිවේරිය, සඳකඩපහන ප්‍රකාශන.
- දිසානායක, විමල් (2009). සංවර්ධන හා සන්නිවේදනය, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- නානායක්කාර, සේන (2008). සංවර්ධනාත්මක සන්නිවේදනය, කර්තෘ ප්‍රකාශනයකි.
- විතානගේ, චන්ද්‍රසෝම (1993). තුන්වන ලෝකයේ සංවර්ධන සන්නිවේදනය, කොට්ටාව, සාර ප්‍රකාශන.

- ජිනදාස, මනෝජ් පුෂ්පකුමාර, (2011). සංවර්ධනය, පර්යේෂණය හා මහජන සම්බන්ධතාව, කර්තෘ ප්‍රකාශනයකි.
- Mahendra, Sunanda (1997). Memory and Message Key Terms in Culture and Communication, Colombo, M.D. Gunasena and Co. Ltd.
- Dudley Seers, (1977).The morning of Development: International Development Review, No. 3 (Article) I, The Development Process: A Special Perspective, London, Hutchinson.
- Wilbur Schramm, (1964). Mass Media and National Development, California, Stanfored University Press.
- George Garbner, (1972). Mass Media and Human Communiction; Theory in Sociology of Mass Communication, London, Penguin Book.
- http;//www.un.org/millenniumgoals.
- http;//si.wikipedia.org/wiki/sustainbledevelopment.
- http;//si.wikipedia.org/wiki/participatoryuralappraisal.